# 19

# සූරා අල්මාඋෟන්

## سُوْرَةُ الْمَاعُوْنْ

අල්ලාහු තආලාගේ ආශ්චර්යවත් දේව ග්‍රන්ථය වන අල් කුර්ආනය පාරායනය කිරීමේ මහිමය හා එය තේරුම් ගැනීමේ වැදගත්කම පිළිබඳ ව කලින් පාඩමෙන් උගත්තෙමු. එහි දේශනා තේරුම් ගැනීමේ උත්සාහයක් ලෙස සූරා අල් මාඋෟන් නම් පරිච්ඡේදය දෙස අවධානය යොමු කරමු.

මෙය අල් කුර්ආනයේ 107 වන පරිච්ඡේදය වේ. ආයත් 7කින් සමන්විත වූ මෙම සූරාව මක්කාවේ දී පහළ විය. මෙහි මුල් ආයත් තුන මක්කාවේ ද අවසන් ආයත් හතර මදීනාවේ ද පහළ විය. මෙහි අවසන් වාක්‍යයෙහි අවසන් වචනය ලෙස සඳහන්ව ඇති "අල් මාඋෟන්" නම් පදය සූරාවේ නම ලෙස සඳහන් වී ඇත. මෙම සූරාවේ තේරුම "අල්ප වස්තූන්" යන්න යි. දැන් සූරාව හා එහි තේරුම දැන ගනිමු.



سورة الماعون مكية وهي سبع آيات

بسم الله الرحمن الرحيم

أرأيت الذي يكذب بالدين (1) فذلك الذي يدع اليتيم (2) و
لا يحض على طعام المسكين (3) فويل للمصلين (4) الذين هم عن
صلاتهم ساهون (5) الذين هم يراءون (6) ويمنعون الماعون (7)

මහා කාරුණික පරම දයාබර අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි.
(1) (නබිවරයාණෙනි) විනිශ්චය (දිනය) අසත්‍යය කරන්නා නුඹ දුටුවෙහි ද?
(2) එබැවින් ඔහු ම ය අනාථයා පලවා හරින්නා.
(3) තව ද ඔහු දුප්පතුන්ට ආහාර නොසපයන අතර අන් අය ඒ කෙරෙහි දිරිගන්වන්නේ ද නැත.
(4) නොසැලකිල්ලෙන් සලාතය ඉටු කරන්නන් කෙරෙහි විනාශය අත් වේවා!
(5) ඔවුන්ගේ සලාතය පිළිබඳ ව නොසැලකිලිමත් ව සිටින්නෝ ඔවුහු ම ය.
(6) තව ද ඔවුහු සලාතය ඉටු කළත් ජනයාට පෙන්වීම සඳහා ම ඉටු කරති.
(7) තව ද ඔවුහු අල්ප වස්තූන් (අතමාරුවට දීම) ප්‍රතික්ෂේප කරති.

**මෙම සූරාව අපට බොහෝ ආදර්ශ ලබා දෙන්නේ ය.**

1. "මෙම ලෝකයේ කරන යහ ක්‍රියාවලට ප්‍රතිලාභය ද අයහපත් ක්‍රියාවලට දඬුවම ද එලොවෙහි දී ලැබෙයි" යන මිනිසාගේ විශ්වාසය හේතුවෙන් ම ඔහු මැවීම්වලට ආදරය කිරීමට ද, අල්ලාහු තආලාට කළ යුතු යුතුකම් මැනවින් ඉටුකර තමාගේ ජීවිතය යහමගෙහි ගෙන යාම කෙරෙහි ද ඉවහල් වන ප්‍රධාන සාධකයක් වේ.

2. කවර මිනිසකුගේ සිතෙහි අවසාන දිනය පිළිබඳ විශ්වාසය ගැඹුරින් සටහන් නොවී තිබේ ද, ඔහු ය, අනාථයන්ට කෲර ලෙස සලකන්නේ. ඔවුහු පහත් ලෙස සලකා පළවා හැරිනි ඔවුන්ගේ අයිතිවාසිකම් අහෝසි කර, හිංසා කර දේපළ ද පැහැර ගැනෙති. මීට හාත්පසින් ම වෙනස්ව අනාථයන් හා දිළිඳුන් සාදරයෙන් පිළිගෙන ඔවුන්ට සංග්‍රහ කිරීම විනිශ්චය දිනය විශ්වාස කරන්නාට සාක්ෂියකි.

3. දිළිඳුන්ට ආහාර පාන දීම පමණක් නොව, ඔවුන්ට ආහාර පාන දීම කෙරෙහි අනුන් උනන්දු කරවීම ද අවසාන දිනය පිළිබඳ ව විශ්වාස කිරීමේ සලකුණකි.

4. ඉස්ලාමයේ කුමන ක්‍රියාවක් වුව ද එය පරිශුද්ධ චේතනාවෙන් ඉටු නොකිරීමෙන් අල්ලාහු තආලාගෙන් ඊට කිසි දු වටිනාකමක් හිමි නොවන්නේ ය. "අන් අය අප බලා අගය කළ යුතු යි" යන චේතනාවෙන් ඉටු කරන සලාතයෙන් ද ප්‍රයෝජනයක් නැතිව යයි. ඔවුහු සලාතයේ ශාරීරිකව ඉටු කරති. එම සලාතය ඔවුන්ගේ සිත් හා බැඳී නොපවතී. පාරායනය කිරීම ද ඔහුගේ සිත වටහා නොගනී. සලාතයේ යථාර්ථය පිළිබඳව ඔවුන් සිතා බලන්නේ ද නැත. එබැවින් සැබෑ ලෙස ඉටු කරන සලාතය හෝ ප්‍රයෝජනවත් සලාතය වන්නේ සිතේ ඒකාකාරී භාවය හා යථාර්ථය තහවුරු කර දෙවියන් වෙනුවෙන් පරිශුද්ධ වූ චේතනාවෙන් ඉටු කරනු ලැබීමයි.

5. "අල්ප වස්තුවක් පවා තාවකාලික පාවිච්චිය සඳහා හෝ අනුන්ට දීමට කවරකුගේ වුව සිතේ කැමත්තක් ඇති වූයේ නැත්නම් ඔහුගේ අවසාන දිනය පිළිබඳ විශ්වාසයෙහි දෝෂයක් ඇත" යන තේරුම ගෙන දේ. ඔහුගේ සලාතය ඔහු තුළ වෙනසක් ඇති නොකිරීම මෙහි සත්‍යතාවයි.

එම නිසා මෙම සූරාව මැනවින් වටහා ගෙන, එය වනපොත් කර එහි දේශනා සිත් පතුලෙහි සටහන් කර යහ ක්‍රියාවල යෙදී ජය ලබා ගැනීමට මං පාදා ගනිමු.

## අභ්‍යාස

සුදුසු වචනය වරහනින් තෝරා ලියන්න.

1. සූරා අල් මාඌන් අල් කුර්ආනයේ (103/ 105/ 107) වන පරිච්ඡේදය වේ.
2. "අල් මාඌන්" යන්නෙහි තේරුම (උදව්ව/ දොස් කීම/ අල්ප වස්තු) වේ.
3. සූරා අල් මාඌනයේ සඳහන් "අද් දීන්" යන වචනයෙහි තේරුම (ආගම/ දීමනා ලබා දෙන දිනය/ නැගිට සිටිනා දිනය) වේ.
4. "සලාතය ඉටු කරන්නාට විනාශය අත් වේ!" යන්නෙන් මෙම සූරාව හඳුන්වන්නේ (කඩින් කඩ සලාතය ඉටු කරන්නන්/ සලාතය අමතක කර දැමූවන්/ සලාත් නොකරන්නන් ය.)

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (අ) සූරා අල් මාඌනයේ වැකි මඟින් අපට කියා දෙන කරුණු තුනක් ලියන්න.

   (ආ) සූරා මාඌනයේ ආයත් කීයක් තිබේ ද?

   (ඇ) "අල් මාඌන්" යන්නට නිදසුන් කිහිපයක් දක්වන්න.

2. මෙම පරිච්ඡේදය දේව විශ්වාසය හා සමූහ ජීවිතය යන කරුණු දෙක කෙසේ සම්බන්ධ කරයි ද?
3. "විනිශ්චය දිනය විශ්වාස නොකරන්නා" දැක්වීමට මෙම සූරාව ඉදිරිපත් කරන ඔහුගේ ලක්ෂණ සඳහන් කරන්න.
4. අපගේ සලාතයන් ජීවමාන කිරීමට කළ යුතු ක්‍රියා මාර්ග මොනවා ද?
5. අනාථයන්ට හා දුප්පතුන්ට උපකාර කිරීමට අදාළ ක්‍රියා මාර්ග සමහරක් සඳහන් කරන්න.

## යා කරන්න

| | |
|---|---|
| *1.* සලාතන ඉටු කැන්නාට අලාභය වේ. | اَرَءَيْتَ |
| *2.* නුඹ දුටුවේ නැද්ද? | يَدُعُّ الْيَتِيْمَ |
| *3.* අල්ප දෙයද වලක්වන්නන්. | يُرَاءُوْنَ |
| *4.* අනාථයන් පළවා හරින්නන්. | فَوَيْلٌ لِّلْمُصَلِّيْنَ |
| *5.* අන්‍යන්හට පෙන්වීමට. | وَيَمْنَعُوْنَ الْمَاعُوْنَ |